**ශීර්ෂය 265 - මන්නාරම දිස්ත්‍රික් ලේකම් කාර්යාලය පිළිබඳ විගණකාධිපති වාර්තාව - 2016 වර්ෂය**

ශීර්ෂය 265 - මන්නාරම දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, පොත්පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2017 ඔක්තෝබර් 25 දින දිස්ත්‍රික් ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙනයාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරිගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වා ගෙනයාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**2. ගිණුම්**

**2.1 විසර්ජන ගිණුම**

**(අ) මුළු ප්‍රතිපාදනය හා වියදම**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 399.00 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 382.72 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.මිලියන 16.28 ක් හෙවත් සියයට 4.08 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| **වියදම** | **2016 දෙසැම්බර් 31 දිනට** | | | **ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස** |
|---|---|---|---|---|
| | **ශුද්ධ ප්‍රතිපාදනය** | **උපයෝජනය** | **ඉතිරිය** | |
| | **රු. මිලියන** | **රු. මිලියන** | **රු. මිලියන** | |
| පුනරාවර්තන | 212.00 | 198.00 | 14.00 | 6.60 |
| මූලධන | 187.00 | 184.72 | 2.28 | 1.22 |
| **එකතුව** | **399.00** | **382.72** | **16.28** | **4.08** |

**(ආ)** **වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය**

වෙනත් අමාත්‍යාංශ 24 ක් හා දෙපාර්තමේන්තු 12 ක් විසින් එකතුව රු. මිලියන 2,176.13 ක් වූ ප්‍රතිපාදන දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත ලබාදී තිබූ අතර එම ප්‍රතිපාදනවලින් රු.මිලියන 2,055.93 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව ප්‍රතිපාදනවලින් රු.මිලියන 120.20 ක් හෙවත් සියයට 5.52 ක් ඉතිරි වී තිබුණි.

## 2.2 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාළ විෂය අංක 26501 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| **වියදම** | | **ලැබීම්** | | **හර ශේෂය** | |
|---|---|---|---|---|---|
| **උපරිම සීමාව** | **තථ්‍ය** | **අවම සීමාව** | **තථ්‍ය** | **උපරිම සීමාව** | **තථ්‍ය** |
| **රු. මිලියන** | **රු. මිලියන** | **රු. මිලියන** | **රු. මිලියන** | **රු. මිලියන** | **රු. මිලියන** |
| 13.00 | 12.96 | 7.50 | 9.82 | 50.00 | 42.29 |

## 2.3 පොදු තැන්පත් ගිණුම

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ පොදු තැන්පත් ගිණුමේ ගිණුම් 07 ක 2016 දෙසැම්බර් 31 දිනට ශේෂ එකතුව රු.මිලියන 97.10 ක් විය. විස්තර පහත දැක්වේ.

| **තැන්පත් ගිණුම් අංකය** | **2016 දෙසැම්බර් 31 දිනට ශේෂය** |
|---|---|
| | **රු. මිලියන** |
| 6000/0000/00/0001/0103/000 | 0.10 |
| 6000/0000/00/0017/0028/000 | 1.94 |
| 6000/0000/00/0013/0098/000 | 28.50 |
| 6000/0000/00/0014/0017/000 | 3.44 |
| 6000/0000/00/0016/0089/000 | 55.58 |
| 6000/0000/00/0018/0093/000 | 0.19 |
| 6000/0000/00/0020/0016/000 | 7.35 |
| **එකතුව** | **97.10** |

**2.4 විගණන නිරීක්ෂණ**

මන්නාරම දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2016 දෙසැම්බර් 31 දිනට විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් විගණන නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් විගණන නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ මෙම වාර්තාවේ 3 ඡේදයේ සඳහන් කර ඇත.

**3. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ**

**3.1 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

පහත දැක්වෙන ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණි.

| ලේඛන වර්ගය | අදාළ රෙගුලාසිය |
|---|---|
| පොත් නාමාවලිය | කච්චේරි මාර්ගෝපදේශ අත්පොත 5:9 |
| පාඩු පිළිබඳ ලේඛනය | මුදල් රෙගුලාසි 110 |
| බැරකම් ලේඛනය | මුදල් රෙගුලාසි 214 |
| ප්‍රසම්පාදන කාල උපලේඛනය | 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය- 4.2.2 මාර්ගෝපදේශය |
| ස්ථාවර වත්කම් ලේඛනය | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය |
| පරිගනක, උපාංග හා මෘදුකාංග පිළිබඳ ලේඛනය | 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඒඅයි/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය |

**3.2 විසර්ජන ගිණුම**

**අයවැය විචලනය**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ පුනරාවර්තන වැය විෂයයන් 2 ක හා ප්‍රාග්ධන වැය විෂයයන් 2 ක පිළිවෙලින් රු.8,227,757 ක් හා රු. 2,240,420 ක් හෙවත් සියයට 35 හා සියයට 75 ක සැලකිය යුතු ඉතිරිවීම් නිරීක්ෂණය විය. කෙසේ වුවද, අයවැය ඇස්තමේන්තු තත් කාර්ය පදනමින් පිළියෙල කර තිබීම හා විධිමත් ප්‍රසම්පාදන සැලැස්මකින් තොරව පිළියෙල කිරීම හේතුවෙන් විගණනයට ඉදිරිපත් කරන ලද හේතු දැක්වීම් විගණනයේදී පිළිගත නොහැකි විය.

**3.3 පොදු තැන්පත් ගිණුම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ තැන්පත් ගිණුමේ ශේෂයෙහි දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ පොත්පත් හා භාණ්ඩාගාර පරිගණක මුද්‍රිතය අතර රු. 31,375 ක වෙනසක් නිරීක්ෂණය විය. කෙසේ

වෙතත්, සමාලෝචිත වර්ෂයේ විසර්ජන ගිණුමේ මෙම වෙනස දක්වා නොතිබුණු අතර මෙම වෙනසට හේතුද විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) තැන්පත් ගිණුමේ වර්ෂ 1 සිට වර්ෂ 3 දක්වා කල් ඉකුත් වූ රු. මිලියන 3 ක ශේෂයක් පැවති අතර ඒ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

**3.4 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම**

---

විශ්‍රාම ගිය නිලධාරීන් තිදෙනෙකුගෙන්, සේවය හැරගිය නිලධාරියෙකුගෙන් සහ ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයේ 4.5 වගන්තිය ප්‍රකාරව වැඩ තහනමට ලක්වූ එක් නිලධාරියෙකුගෙන්ද අයවිය යුතු එකතුව රු. 699,540 ක් වූ ණය ශේෂ වර්ෂ 01 සිට 17 කට අධික කාලයක සිට අයනොවී පැවතුණි.

**3.5 වත්කම් කළමණාකරනය**

---

**නිෂ්කාර්ය හා ඌන උපයෝජිත වත්කම්**

---

පොදු සම්පත් විධිමත්ව උපයෝජනය කිරීම තහවුරු කර ගැනීමට අර්ථවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අයත් මෝටර් බයිසිකල් 10ක් හා ගොඩනැගිලි 02 ක් නිෂ්කාර්යව පැවතීමට ඉඩහැර තිබුණු අතර වර්ෂ 01 සිට 03 දක්වා ඌන උපයෝජිතව පැවතිණි.

**3.6 අනුකූල නොවීම්**

---

**නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

---

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම් පහත විග්‍රහ කර දැක්වේ.

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|
| | රු. | |
| (අ) **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | |
| (i) මුදල් රෙගුලාසි 396 | 177,312 | මාස 06 ක් ඉක්මවූ රු. 177,312 ක් වටිනා නිකුත් කළ නමුත් ඉදිරිපත් නොකළ චෙක්පත් 53 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි 757 | - | සමාලෝචිත වර්ෂය සඳහා භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල වාර්තාව මගින් පෙන්වා දෙන ලද ඌනතා හා අතිරික්තතා සහ අනෙකුත් නිර්දේශයන් පිළිබඳව පසු විපරම් කටයුතු දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 5කින් සිදුකර නොතිබුණි. |

| | | | |
|---|---|---|---|
| (ආ) | 1990 ඔක්තෝබර් 10 දිනැති අංක. 41/90 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | - | දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අනුයුක්ත කර ඇති වාහන 04 ක් සම්බන්ධයෙන් මාස 06 කට වරක් ඉන්ධන දහනය පිළිබඳ පරීක්ෂාවක් සිදු කර නොතිබුණි. |

**3.7 කොන්ත්‍රාත් පරිපාලනය**

---------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් සිදු කෙරේ.

**(අ) මන්නාරම දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සඳහා නව ගොඩනැගිල්ලක් ඉදිකිරීම**

---------------------------------------------------------------------------------------

මන්නාරම දිස්ත්‍රික් ලේකම් කාර්යාලය ඉදිකිරීම වෙනුවෙන් රු. 913,000 ක ප්‍රමාද ගාස්තුවක් අයකරගත යුතු බවට දිස්ත්‍රික් ඉංජිනේරුවරයා විසින් නිර්දේශ කර තිබුණද රු.456,500 ක් පමණක් කොන්ත්‍රාත්කරුට සිදු කළ ගෙවීම්වලින් අඩු කරගෙන තිබුණු බව නිරීක්ෂණය විය.

**(ආ) තිරුකේදීස්වරම් පෙර පාසැල ඉදිකිරීම**

-------------------------------------------

තිරුකේදීස්වරම් පෙර පාසැල් ගොඩනැගිල්ල ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව රු. මිලියන 1.5 ක ඇස්තමේන්තුවකට කොන්ත්‍රාත් සමාගමක් වෙත පිරිනමා තිබුණු අතර 2016 දෙසැම්බර් 11 දින හෝ ඊට පෙර වැඩ නිම කළ යුතු විය. කෙසේ වෙතත් ඉදිකිරීම් කටයුතු 2017 ඔක්තෝබර් 25 දින වන විටත් නිමකර නොතිබුණු අතර පිළිගත හැකි හේතූන් විගණනයට ඉදිරිපත් නොවිණි.

**(ඇ) බටහිර අරිප්පුහි නල ළිඳක් ඉදිකිරීම**

------------------------------------------

බටහිර අරිප්පු හි ඉදිකරන ලද විවෘත පොදු ළිඳක් තිබියදී සනීපාරක්ෂක පහසුකම් සැපයීමේ අරමුණින් එම ස්ථානයේම තවත් නල ළිඳක් ඉදිකිරීමට රු. 242,600 ක් වැය කර තිබුණි. එබැවින් මේ සඳහා යෙදවූ මුදල් නිෂ්ඵල වියදමක් බවට පත්වී තිබේ. තවද ඉදිකිරීමෙන් මාස කිහිපයකට පසු නල ළිඳ හානියට පත්වී තිබුණි. මේ සම්බන්ධයෙන් මුසලි ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

**(ඈ) මරිච්චිකට්ටි පෙර පාසැල ඉදි කිරීම**

------------------------------------------

මරිච්චිකට්ටි පෙර පාසැල ඉදි කිරීම සඳහා රු. 989,000 ක් උපයෝජනය කර තිබූ අතර 2016 නොවැම්බර් 05 දින දිස්ත්‍රික් ලේකම්වරයාට මෙම ගොඩනැගිල්ල භාරදී තිබුණි. ගොඩනැගිල්ලේ පෝටිකෝව සහ වැසිකිලියද සැලැස්මේ අන්තර්ගත වී තිබුණද එම සැලැස්මට අනුව ඉදිකිරීම් සිදු කර නොතිබුණි. එය හේතුකොටගෙන අදාල කාර්යය සඳහා 2017 ඔක්තෝබර් 25 දින දක්වාම මෙම ගොඩනැගිල්ල භාවිතයට ගත නොහැකි වී තිබුණි.

**(ඉ) දෙවාන්පිටි පොදු ශාලාව ඉදිකිරීම**

ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ග්‍රාමීය යටිතල පහසුකම් ව්‍යාපෘතිය මගින් දේවාන්පිටි පොදු ශාලාව ඉදිකිරීම සඳහා රු.1,000,000 ක් වෙන්කර තිබුණි. මෙම කොන්ත්‍රාත්තුව 2016 සැප්තැම්බර් 5 දින ග්‍රාමීය සංවර්ධන සමිතියකට පිරිනමා තිබුණි. 2017 ජූලි 06 වන දින වන විටත් කොන්ත්‍රාත්තුව නිම කර නොමැති බව විගණනයේදී නිරීක්ෂණය විය. කෙසේ වෙතත් තාක්ෂණික නිලධාරී විසින් ඉදිරිපත් කරන ලද ව්‍යාජ වාර්තා පදනම් කරගෙන සම්පූර්ණ මුදලම කොන්ත්‍රාත්කරුට ගෙවා තිබුණි.

**(ඊ) වැඩියෙන් ගෙවීම්**

පහත ඉදිකිරීම් කාර්යයන් වෙනුවෙන් කොන්ත්‍රාත්කරුවන්ට රු. 177,572 ක මුදලක් වැඩිපුර ගෙවා තිබුණි. කළවැඩ විස්තර පහත දැක්වේ.

| කොන්ත්‍රාත්තුවේ නම | බිල්පත් අනුව කළ වැඩ වටිනාකම | සත්‍ය කළ වැඩ අනුව කළ වැඩ වටිනාකම | වැඩිපුර ගෙවීම |
|---|---|---|---|
| | රු. | රු. | රු. |
| විදාතල්තීවු අභ්‍යන්තර මාර්ගය | 639,268 | 616,042 | 23,226 |
| විදාතල්තීවු බටහිර අභ්‍යන්තර මාර්ගය | 670,394 | 597,556 | 72,838 |
| තේවාන්පිඩි පොදු ශාලාව | 57,200 | 45,920 | 11,280 |
| පනියමලර් මාදා අභ්‍යන්තර මාර්ගය | 70,228 | නැත | 70,228 |
| **එකතුව** | **1,437,090** | **1,259,518** | **177,572** |

## 3.8 ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

**අභ්‍යන්තර විගණනය**

(අ) අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කර තිබුණද විගණන හා කළමණාකරන කමිටුව මගින් ලබා දෙන ලද නිර්දේශ මත ඵලදායි ක්‍රියාමාර්ග සමාලෝචිත වර්ෂය තුලදී ක්‍රියාත්මක කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය සඳහා දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ අභ්‍යන්තර විගණන අංශය සඳහා මාසික අභ්‍යන්තර විගණන වැඩසටහන් පිළියෙල කර නොතිබුණි. තවද, අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර නොතිබුණි.

**3.9** **මානව සම්පත් කළමණාකරනය**

**-----------------------------------------**

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

**-----------------------------------------------------------**

2016 දෙසැම්බර් 31 දිනට සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෝෂ්ඨ මට්ටම | 22 | 20 | 02 |
| (ii) | තෘතීයික මට්ටම | 17 | 01 | 16 |
| (iii) | ද්විතික මට්ටම | 350 | 257 | 93 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 55 | 37 | 18 |
| | **එකතුව** | **444** | **315** | **129** |

පුරප්පාඩු වූ විවිධ තනතුරු 129 ක් පිරවීමට හෝ මානව සම්පත්වල තථ්‍ය අවශ්‍යතාවය සමාලෝචනය කිරීමෙන් පසු අනුමත කාර්ය මණ්ඩලය සංශෝධනය කිරීමට කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.